# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO
2049/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
30/07/2024
පැය1520

# මාධ්‍ය නිවේදනය

## 01. බඹර ප්‍රහාරයක් - කින්නියා පොලිස් වසම.

2024.07.30 වන දින උදෑසන කාලයේ කින්නියා පොලිස් වසමේ කින්නියා අල් අක්ෂා පිරිමි විද්‍යාලයේ ගොඩනැගිල්ලක වහලේ තිබූ බඹර කූඩයක කොටසක් කඩා වැටීමෙන් එම විද්‍යාලයේ ඉගෙනුම ලබන වයස අවුරුදු 10ත් 15ත් අතර ළමුන් පිරිසක් පිරිසක් බඹර ප්‍රහාරයකට ලක්ව ඇති බවට කින්නියා පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**බඹර ප්‍රහාරය හේතුවෙන් වයස අවුරුදු 10ත් 15ත් අතර ළමුන් 42 දෙනෙකු තුවාල ලබා කින්නියා රෝහල වෙත ඇතුලත් කර ඇත. මොවුන් කින්නියාය වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කින්නියා පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - සන්දිවේලි පොලිස් වසම.

2024.07.30 වන දින උදෑසන කාලයේ සන්දිවේලි පොලිස් වසමේ ත්‍රිකුණාමලය A15 ප්‍රධාන මාර්ගයේ කිරාන් යුනියන් හන්දියේ දී වාලච්චේන සිට මඩකලපුව දෙසට ධාවනය වූ වෑන් රථයක් වාලච්චේන දෙසට ගමන් කිරීම සඳහා ප්‍රධාන මාර්ගය හරහා ගමන් කරන ලද යතුරු පැදියක ගැටී මාර්ගයේ ඉදිරියට ඇදී ගොස් තවත් පදිකයෙකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා වාලච්චේන රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වන කෝවිල් පාර, කිරාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සන්දිවෙලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - වේයන්ගොඩ පොලිස් වසම.

2024.07.29 වන දින සවස් කාලයේ වේයන්ගොඩ පොලිස් වසමේ ගම්පහ දිවුලපිටිය ප්‍රධාන මාර්ගයේ නයිවල හන්දියේ දී නයිවල සිට දිවුලපිටිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් දිවුලපිටිය සිට නයිවල දෙසට ධාවනය වූ ඩීමෝ බට්ටා ලොරි රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු ගම්පහ රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වන උඩුගම වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - බොරලැස්ගමුව පොලිස් වසම.

2024.07.29 වන දින රාත්‍රී කාලයේ බොරලැස්ගමුව පොලිස් වසමේ බොරලැස්ගමුව දෙස සිට මහරගම මාර්ගයේ බොරලැස්ගමුව ප්‍රදේශයේ දී බොරලැස්ගමුව සිට මහරගම දෙසට ධාවනයවූ ජීප් රථයක් මාර්ගය හරහා පාර මාරු වීමට ගිය පුද්ගලයකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා ප්‍රතිකාර සඳහා කොතලාවල ආරක්ෂක විද්‍යාලීය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වන දෙමෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොතලාවල ආරක්ෂක රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බොරලැස්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මොරටුව පොලිස් වසම.

2024.07.30 වන දින අළුයම් කාලයේ මොරටුව පොලිස් වසමේ මොරටුව කොරවැල්ල මැද මාර්ගයේ ශාන්ත මයිකල් දේවස්ථානය අසලදී මොරටුව සිට පානදුර දෙසට කොරවැල්ල මැද මාර්ගයේ ධාවනයවූ ත්‍රිරෝද රථයක් ශාන්ත මයිකල් පල්ලිය අසල පිහිටා තිබූ නිවසක තාප්පයේ සහ යකඩ ගේට්ටුවේ ගැටී ත්‍රී රෝද රථය පෙරළී යාමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රී රෝද රථයේ රියදුරු බරපතල තුවාල ලබා පානදුර රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වන දෙනියාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**